සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	පැය மணித்தியாலம் Hours
11	භූගෝල විද්‍යාව	I	01

නම :- ..... විභාග අංකය :- .....

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
(ii) එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් අනුව සියළුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

• අංක 01 සිට 10 තෙක් වගන්ති හොඳින් කියවා නිවැරදි නම් නි වටාද වැරදි නම් වැ වටාද රවුමක් අඳින්න.

(01) ලෝකයේ ගැඹුරුම මිරිදිය විල වන්නේ බයිකල් විලයි. නි / වැ

(02) මහිද්වීප නිර්මාණය වී ඇත්තේ සියල් පාෂාණ ස්ථරයෙනි. නි /වැ

(03) පෘථිවි පෘෂ්ඨයෙන් 71% ශීලා ගෝලයට අයත් වේ. නි / වැ

(04) යමහල් ක්‍රියාකාරීත්වය පවතින ප්‍රදේශවල උණුදිය උල්පත් පැවතිය හැක. නි / වැ

(05) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය සාගරික තැටියකි. නි / වැ

(06) ශ්‍රී ලංකාවට අයත් මන්නාරම් දිස්ත්‍රික්කය වෙරළ තීරයේ පිහිටියත් එහි උෂ්ණත්වය අනුරාධපුරයට වඩා වැඩිය. නි / වැ

(07) යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආශ්‍රිත ගැටලුවකි. නි / වැ

(08) නිග්‍රෝ හා පිග්මි වරු පරිසරයේ කටුක බවට හැඩගැසී ජීවත්වන ජන කොට්ඨාසයකි. නි / වැ

(09) " චීනයේ අදෝනාව" යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ හොවැංහෝ ගංගාවයි. නි / වැ

(10) සරල තීරු ප්‍රස්ථාර තිරස්ව හෝ සිරස්වද නිර්මාණය කළ හැක. නි / වැ

• අංක 11 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

(11) පෘථිවි පෘෂ්ඨයේ සිට කිලෝමීටර් ..... ක් පමණ ඉහළට වායුගෝලය විහි දේ
(150, 200, 250)

(12) මහාද්වීප තැටි දෙකක් එකට ගැටීමෙන් ..... පද්ධති නිර්මාණය වේ. (නැමි කඳු, සුනාමි, භූමි කම්පා)

(13) කිරි ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ලෝකයේ ප්‍රසිද්ධ උත්තරාර්ධ ගෝලයේ රටකි. .....
(එංගලන්තය, ඩෙන්මාර්කය,බ්‍රසිලය)

(14) ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද මුල්ම ඉඩම් ජනපද කරණය ..... ව්‍යාපාරයයි. (මහවැලි, උඩවලවේ, ගල්ඔය)

(15) නැව්, ගුවන්යානා, මෝටර් රථ නිෂ්පාදනය කර්මාන්ත ..... සනයට අයත් වේ. (යකඩ හා වානේ, එකලස් කිරීමේ, ඉලෙක්ට්‍රෝනික්)

(16) ශ්‍රී ලංකාවේ කාර්මික උද්‍යාන ඇරඹීමේ වැඩ පිළිවෙළ යටතේ පළමු වෙන්ම අරඹන ලද්දේ ..... (බට අත, සීතාවක, මතුගම)

(17) ලොව අධිකතම ලවණ සාන්ද්‍රනයකින් යුක්ත වන්නේ ..... මුහුදය. (මළ , කැස්පියන්, අරාබි)

(18) ශ්‍රී ලංකාවේ සීගිරිය,දඹුල්ල යන ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන්නේ ..... පාෂාණ වේ. (නයිස්, හුණු ගල්, ශල්ක)

(19) ලෝක ජන සංඛ්‍යාව ඉතා වේගවත් ලෙස වර්ධනය වීමට පටන් ගත්තේ ..... ආරම්භයේ සිටයි. (17 වන සියවස, 18 වන සියවස, 20 වන සියවස)

(20) අධි තාක්ෂණය උපයෝගී කරගනිමින් විදුලි බලයෙන් ක්‍රියාත්මක වන උමං දුම්රිය මාර්ග සහිත රටක් ලෙස ..... හැඳින්විය හැක. (ඉන්දියාව, නේපාලය, සිංගප්පුරුව)

- **අංක 21 සිට 30 දක්වා වාක්‍යවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(21) 16 වන සියවසේ දී මහාද්වීප ප්ලාවිත කල්පිතය ඉදිරිපත් කළේ ..... නම් විද්‍යාඥයයි.

(22) වර්ෂයේ එක් කාලයකදි ගස්වල පතු හැලි යන මධ්‍ය අක්ෂාංග වල පිහිටි වෘක්ෂ ලතා විශේෂය..... වෘක්ෂලතා නම් වේ.

(23) ශ්‍රී ලංකාවේ වෙරළ බඩ මෝය හා කලපු ආශ්‍රිතව දක්නට ලැබෙන වෙරළබඩ පරිසරයට අනුවර්තනය වූ ශාක විශේෂයකි. ..... ශාඛ.

(24) ශ්‍රී ලංකාවේ තනි භෝගයක් ලෙස වැඩි බිම් ප්‍රමාණයක් යොදවා ඇත්තේ ..... වගාව සඳහායි.

(25) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 0මි අඩුය. ස්ථිර අයිස් තට්ටුවකින් නිරන්තරයෙන්ම පොළොව වැසී පවතී. මෙය ..... නම් වේ.

(26) සජීවී ද්‍රව්‍ය විපරීතකරණයට භාජනය වීමෙන් ..... පාෂාණ නිර්මාණය වේ.

(27) 2015 වර්ෂයේ පිහිටවුන ලද සත්ව උද්‍යානය පිහිටියේ ..... දිස්ත්‍රික්කයේ ය.

(28) වර්තමාන ලෝකයේ ප්‍රධාන ජනාධික කලාප සංඛ්‍යාව ..... කි.

(29) පසුගිය දස වසර තුළ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරික සංක්‍රමණ සඳහා බහුල වශයෙන් බලපා ඇත්තේ ..... ගැටලුවයි.

(30) ආසියා මහද්වීපයේ හා අප්‍රිකා මහද්වීපයේ සීමා වෙන් කරනු ලබන්නේ ..... ඇළෙනි.

- අංක 31 සිට 40 දක්වා ප්‍රශ්න එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරා අංකය ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

(31) අප ජීවත් වන පෘථිවි කබොල ආසන්නයේ ම පවතින්නේ,

(1) මෙසෝ ගෝලයයි (2) පරිවර්ති ගෝලයයි (3) තාප ගෝලයයි (4) අපරිවර්ති ගෝලයයි

(32) ක්‍රැකටෝවා ගිනිකන්ද පිහිටියේ

(1) ඉතාලියේය (2) ජපානයේ ය (3) ඉන්දුනිසියාවේය (4) පිලිපිනයේ ය

(33) යාපන අර්ධද්වීපයෙහි මතු පිට ජලවහන රටාවක් දක්නට නොලැබෙන්නේ,

(1) වසර පුරා පවතින දැඩි නියගයයි (2) වර්ෂාපතනය සීමිත කාලයකට ලැබෙන නිසාය

(3) වාෂ්පී කරණය අධික වීම නිසාය (4) භූගු ගල් සහිත භූ ව්‍යුහයක් පවතින නිසාය

(34) වැලි මඩ සානුව පිහිටියේ

(1) බදුල්ල දිස්ත්‍රික්කයේ ය (2) නුවරඑළිය දිස්ත්‍රික්කයේ

(3) මාතලේ දිස්ත්‍රිකයේය. (4) මහනුවර දිස්ත්‍රික්කයේ

(35) සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය පිහිටුවන ලද්දේ,

(1) 1982 වර්ෂයේය (2) 1994 වර්ෂයේ (3) 1992 වර්ෂයේය (4) 1995 වර්ෂයේය.

(36) මහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නඩත්තු වන මාර්ග පද්ධති වන්නේ

(1) A මාර්ග පද්ධතිය (2) B මාර්ග පද්ධතිය (3) A, B මාර්ග පද්ධතිය (4) C මාර්ග පද්ධතිය

(37) පැම්පාස් තෘණ භූමි දක්නට ලැබෙන්නේ

(1) උතුරු ඇමරිකාවේ (2) දකුණු ඇමරිකාවේ (3) අප්‍රිකාවේ (4) ඕස්ට්‍රේලියාවේ

(38) වර්ෂ 2001 දී ශ්‍රී ලංකාවේ පැවැත්වූ ජන සංගණනය අනුව මිලියන එකකට වැඩි දිස්ත්‍රික්ක 6ක් වාර්තා විය. ඉන් දිස්ත්‍රික්ක 3ක් වන්නේ

(1) කළුතර, ගාල්ල ,රත්නපුර (2) කුරුණෑගල, රත්නපුර, මහනුවර

(3) කොළඹ, කළුතර, ගාල්ල (4) කළුතර, ගම්පහ, ගාල්ල

(39) දඩයම් ප්‍රධාන ජීවොනෝපායයි, නිතර නිතර පදිංචි ස්ථාන මාරු කරයි. තද වර්ෂා කාලවලදී පාම් කොළ වලින් තැණූ පැල්පත් වාසය සඳහා යොදාගනී. මෙම ජන කොට්ඨාසය වන්නේ,

(1) ඇස්කිමෝ වරු (2) නීග්‍රෝ වරු (3) පිග්මී වරු (4) ඇබෝජින්වරු

(40) ලොව රටවල් විශ්ව ගම්මානයක් බවට පත්කරන මාධ්‍ය ජාල කුන වන්නේ

(1) වෙළඳාම, අධ්‍යාපනය, ප්‍රවාහණය (2) සන්නිවේදනය, සංචාරක ව්‍යාපාරය, වෙළඳාම

(3) අධ්‍යාපනය, වෙළඳාම, සන්නිවේදනය (4) වෙළඳාම, සන්නිවේදනය, ප්‍රවාහණය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම් - කොழුම්පු කල්වි වලයම්
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	භූගෝලවිද්‍යාව	පත්‍රය வினாத்தாள் Paper	II	පැය மணித்தியாலம் Hours	02

සැලකිය යුතුයි:

(i) මෙම ප්‍රශ්න පත්‍රයේ I. II. III කොටස් 3 කින් සමන්විත වේ.

(ii) I කොටසේ අ, ආ,කොටස් දෙකටමද, II හා III කොටස් වලින් ප්‍රශ්න හතරකටද පිළිතුරු ලියන්න.

- යටත් පිරිසයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකකත්වත් තෝරා ගන්න.

(අ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(1) සමක රේඛාව (2) රොකී කඳු වැටිය
(3) සුපිරියර් විල් (4) නයිල් ගංගාව
(5) කැස්පියන් මුහුද (6) මරියානා ආගාධය
(7) කම්චැට්කා අර්ධද්වීපය (8) හඩ්සන් බොක්ක
(9) ඩවුන්ස් තෘණ භූමිය (10) පැනමා ඇල (ලකුණු 10)

(ආ) ඔබට වෙත සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම්කරන්න.

(1) කුරුණෑගල (2) අගලවත්ත
(3) වටවල (4) පුල්මුඩේ
(5) ගම්පහ (6) කන්කසන්තුරේ
(7) එප්පාවල (8) සංගමන් කන්ද තුඩුව
(9) හම්බන්තොට (10) පරන්තන් (ලකුණු 10)

(01) (i) වායු ගෝලයේ සංයුතිය, උෂ්ණත්වය. පිඩනය හා බර අනුව ප්‍රධාන කොටස් හතරකට බෙදා දක්වයි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) වායු ගෝලයෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ජෙව ගෝලයේ සමතුලිත තාවය, බිඳවැටීම කෙරෙහි මිනිසාගෙන් එල්ල වන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කර විස්තර කරන්න (ලකුණු 05)

(02) (i) පෘථිවි ව්‍යුහය නිර්මාණය වී ඇති ආකාරය අනුවප්‍රධාන කොටස් තුනකින් සමන්විතවේ. ඉන් 2ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ගිනි කඳු පිහිටි රටවල් නම් කරන්න.
(1) විසුවියස් (2) පුජියාමා (3) එඩ්නා (ලකුණු 03)

(iii) භූ තැටි චලන වල ප්‍රතිඵල දෙකක් දක්වා විස්තර කරන්න (ලකුණු 05)

(03) (i) කෙපන්ගේ දේශගුණික වර්ගි කරණයට අනුව ප්‍රධාන දේශගුණික කලාප තුනකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) නිවර්තන වනාන්තරවල දැකිය හැකි ලක්ෂණ 3ක් දක්වන්න. (ලකුණු 03)

(iii) පහත සඳහන් ලෝක සිතියමෙහි a හා b අක්ෂරවලින් දක්වා ඇති වනාන්තර දෙක නම් කර ඉන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන 2ක් විස්තර කරන්න (ලකුණු 05)



(04) කෘෂිකාර්මාන්තය යනු මිනිස් ශිෂ්ටාචාරයේ අතීතයේ'සිට මිනිසා තම ජීවනෝපාය සඳහා තෝරා ගන්නා ලද්දකි. එය අද සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත්වී ඇත.

(i) ලෝකයේ ප්‍රධාන වශයෙන් වී වගා කරන ආසියාතික ර ටක් ද, තිරිඟු වගා කරන යුරෝපීය රටක් ද නම් කරන්න. (ලකුණු 02)

(ii) තිරඟු වගාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වර්තමානයේ වී වගාවේ නව ප්‍රවණතාවයන් දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) වර්තමානයේ යකඩ හා වානේ කර්මාන්ත සඳහා ප්‍රසිද්ධ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සාර්ථක කර්මාන්තයක් ස්ථාන ගත වීම කෙරෙහි බලපාන සාධක 3ක් දක්වන්න. (ලකුණු 03)

(iii) ඉන්දියාවේ කපු රෙදි පිළි නිෂ්පාදනය කෙරෙහි බලපාන සාධක දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

III කොටස

(06) ශ්‍රී ලංකාවේ ඒ. ඒ ප්‍රදේශවල කැපී පෙනන භෞතික ලක්ෂණ පදනම් කර ගනිමින් භූ විෂමතා කලාප 3කට බෙදා දක්වා ඇත.



(i) සිතියමේ දක්වා ඇති ආකාරයට අංක 1 හා 2 න් දක්වෙන භූ විෂමතා කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) අංක 3ක කලාපයේ දැකිය හැකි භූවිෂමතා ලක්ෂණ 3ක් උදාහරණ සහිතව නම් කරන්න (ලකුණු 03)

(iii) අංක 2 කලාපයේ දැකිය හැකි වගාවන් 2ක් දක්වා ඊට බලපාන භෞතික හා දේශගුණික ලක්ෂණ 2ක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මාන්තයට වැදගත් තැනක් හිමි වීමට බලපාන ප්‍රධාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ තේ වගාව සඳහා හිතකර භෞතික සාධක තුනක් ලියන්න. (ලකුණු03)

(iii) වර්තමාන ශ්‍රී ලංකවේ පොල් වගාව ක්‍රමයෙන් පරිහානියට පත්වෙමින් පවති. එයට බලපාන ප්‍රධාන සාධන දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(08) ශ්‍රී ලංකාව විසිවන ශත වර්ෂය මැද භාගයේ සිට කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුව පවති.

(i) පහත සඳහන් කර්මාන්ත දෙකක් ස්ථාන ගක වී ඇති ප්‍රදේශය බැගින් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ලියා ඉදිරියෙන් ලියන්න.

A පිඟන් නිෂ්පාදන කර්මාන්තය

B කඩදාසි නිෂ්පාදන කර්මාන්තය

C රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තය

D සිනි නිෂ්පාදන කර්මාන්තය (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ඛණිජ පාදක කර්මාන්ත 3ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවට වඩාත් යෝග්‍ය වන්නේ කෘෂි පාදක කර්මාන්තයි. ඊට හේතු 2ක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(09) ශ්‍රී ලංකාවට ඇත අතීතයේ සිටම විවිධ සංක්‍රමණිකයන් පැමිණි බව, වංශ කතාවල සඳහන්වේ.

(i) ශ්‍රී ලංකාවට පැමිණි සංක්‍රමණිකයන් මෙරටට ගොඩ බැසීම සඳහා උදව් වූ පැරණි වරායන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) වර්තමාන ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජන සංක්‍රමණ ඇති වීම කෙරෙහි බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) බාහිර ජන සංක්‍රමණ ශ්‍රී ලංකාවට වාසි මෙන්ම අවාසිද හිමිකර දේ. ඉන් එක් වාසියක් හා අවාසියක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)


උ